**ශීර්ෂය 018 - පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක කාර්යාලය**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මතය**

ශීර්ෂය 18 - පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 10 දින ප්‍රධාන ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජුනි 10 දින ප්‍රධාන ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

#### 2.1.1 ප්‍රතිපාදන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

| | විගණන නිරීක්ෂණ | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව හැකිතාත් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව, සකසුරුවම්කම හා කාර්යක්ෂමතාව ගැන නිසි සැලකිල්ලෙන් යුක්තව ඇස්තමේන්තු සම්පාදනය කර තිබෙන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විශේෂයෙන් වගබලා ගත යුතු වුවත් , සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත පුනරාවර්තන වැය විෂයයන් 02 ක පිළිවෙලින් රු.275,967 ක් හා රු.1,542,614 ක් ලෙස සියයට 69 ක සහ සියයට 77 ක ඉතිරිකිරීම් විය. | පුනරාවර්තන වැය විෂයයන් 2 හි ප්‍රතිපාදන ඉතිරි වීමට හේතු වූයේ වර්ෂයේ අපේක්ෂිත පරිදි විදෙස් ගමන් ඇති නොවීම හා පුද්ගලික කාර්ය මණ්ඩලයේ ගමන් වියදම් සීමා කිරීම මඟින් වියදම් අවම වීමයි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු නිවැරදිව තක්සේරු කළ යුතුය. |
| (ආ) | මූලික ඇස්තමේන්තු සකස් කිරීමේදී අධි ප්‍රතිපාදන සලසා ගැනීම නිසා පුනරාවර්තන වැය විෂයයන් 04 ක රු.43,000,000 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් එකතුව රු.2,700,000 ක ප්‍රතිපාදන මු.රෙ 66 මඟින් වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබියදී , වර්ෂය අවසානයට තවදුරටත් එම වැය විෂයයන්ගේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 18 සිට සියයට 62 දක්වා පරාසයක ඉතිරිවීම් පැවතුණි. | කාර්යාලයෙන් පරිබාහිර රාජකාරී කටයුතු කාර්යාලය තුළ සිටම කළමනාකරණය කිරීම,විද්‍යුත් තැපැල භාවිතය මඟින් ලිපි හා පණිවුඩ යැවීම,මාර්ගගත ක්‍රමය ඔස්සේ සාකච්ඡා පැවැත්වීම, නිල වාහන වෙන් කළ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ නිලධාරීන්ගේ හා ස්ථිර කාර්ය මණ්ඩලයේ නිලධාරීන්ගේ පුරප්පාඩු ඇතිවීම හා සංචිත වාහන භාවිතය අවම වීම, කාර්යාලය මඟින් සංවිධානය කරනු ලබන | වියදම් නිවැරදිව තක්සේරු කර වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | රැස්වීම් අවම වීම හා රැස්වීම් සඳහා සහභාගී වන නිලධාරීන්ට අදාල අමාත්‍යාංශ මඟින්ම ආහාරපාන සඳහා යන වියදම් දැරීමට සැලැස්වීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතුරු විය. | |
| (ඇ) | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ නඩත්තු වියදම් සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය සමාලෝචිත වර්ෂයේදී පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 233 කින් වැඩි කරගෙන තිබුණද, ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් රු.845,336 ක් හෙවත් සියයට 85 ක් ඉතිරිවී තිබුණි. | 2023 වර්ෂය සඳහා ප්‍රතිපාදන වැඩි ප්‍රමාණයක් වෙන් කර තිබුණද යන්ත්‍රෝපකරණ භාවිතය අවම කිරීම නිසා අපේක්ෂිත අයුරින් යන්ත්‍රෝපකරණ නඩත්තු කටයුතු සඳහා වියදම් සිදු නොවිණි. | වියදම් නිවැරදිව තක්සේරු කර වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. |

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම රු.** | **අනුකූල නොවීම** | | |
| (i) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | | |
| (අ) | මුදල් රෙගුලාසි 231 | 200,712 | වෙනත් ලේඛනයක් නොබලා හරි වැරදි බැලීමට හැකිවනු පිණිස සෑම තොරතුරක්ම අදාල වවුචරවල අඩංගු | කාර්යාලය මඟින් තාවකාලික රියදුරෙකු ලෙස ගෙවනු ලබන වැටුප් හා දීමනා පමණක් ප්‍රතිපූර්ණය කර ඇත. එහිදී පැමිණීම ධාවන | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | විය යුතු වුවත්, තාවකාලික රියදුරන් දෙදෙනෙකු වෙත ගෙවා තිබූ මාස 03 ක වැටුප සඳහා පැමිණීම තහවුරු කරන ලියවිලි අමුණා නොතිබුණි. | සටහන් මගින් සහතික කර ගෙන ඇත. | |
| (ආ) | මුදල් රෙගුලාසි 232(2) | 852,506 | වවුචරයට හෝ සාරාංශයට හෝ අඩංගු මුදල ඉලක්කමෙන් මෙන්ම අකුරෙන් ද සටහන් කළ යුතු වුවත්, වවුචර්පත් 09 කට අදාල වැටුප් විස්තරවල ගෙවූ මුදල අකුරෙන් සටහන් කර නොතිබුණි. | ගෙවන ලද මුදල අතපසුවීමකින් අකුරින් සඳහන් කර නොමැත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිලියෙල කිරීමේදී හා එය ක්‍රියාත්මක කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරික්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ අන්තර්ගත කළ යුතු වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම මාර්ගෝපදේශ අංක 13 හි දැක්වෙන ආකෘතිය ප්‍රකාරව ඉදිරිපත් කර නොතිබුණි. | 2023 වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුලත් කර ඇති වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම කාර්තුමය වශයෙන් සකසා ඇති අතර, ඉන්පසුව 2024 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මෙහි මාසික වශයෙන් සකස් කර ඉදිරිපත් කර ඇත. | චක්‍රලේඛයේ සඳහන් ආකෘතිය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම පිළිබඳ මාර්ගෝපදේශය 12 අනුව අදාල වර්ෂය සඳහා අනුමත අයවැය පදනම් කරගත් ප්‍රමුඛතාව අනුව සකස් කළ ක්‍රියාකාරී සැලැස්ම, ක්‍රියාත්මක කාල රාමුව හා එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමැවුම් එක් එක් මාසයට අදාලව ඉදිරිපත් කළ යුතු වුවත්, ආයතනය විසින් කාර්තුමය පදනමට එය සකස් කර තිබුණි. | 2024 වර්ෂයේ සිට අදාල චක්‍රලේඛයේ විධිවිධාන පරිදි එය මාසිකමය වශයෙන් සකස් කර ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. | චක්‍රලේඛයේ ඇතුළත් මාර්ගෝපදේශයන්ට අනුකූලව ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| කාර්යාලයේ අනුමත සේවක සංඛ්‍යාව 45 ක් වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 42 ක් වූයෙන් පුරප්පාඩු සේවක සංඛ්‍යාව 03 ක් විය. ඒ තුල ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් දෙදෙනෙක් විය. | මෙම පුරප්පාඩුව පිරවීම සඳහා අවශ්‍ය කටයුතු සුදානම් කරමින් පවතී. | ආයතනයේ කාර්යයසාධනය සඳහා බලපාන පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කළ යුතුය. |